# අධ්‍යාපනපති (සාමාන්‍ය)
# පූර්ණ කාලීන පාඨමාලාව
# 2014/2015

## ශිෂ්‍ය අත්පොත

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
2014

## අධ්‍යාපන පීඨයෙහි දැක්ම

අධ්‍යාපනයෙහි නව දැනුම සොයාගොස්, එමගින්
ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය හා
ප්‍රතිපෝෂණය මගින් ජාතික සංවර්ධනයට
දායකවීම

## *අධ්‍යාපනපති (සාමාන්‍ය) පාඨමාලාව 2014/2015*

**පාඨමාලාවේ කාලය** : සෙමෙස්තර දෙකකි. එනම් අවුරුදු එකකි.

**අන්තර්ගතය:**

***පළමු සෙමෙස්තරය*** **(අනිවාර්ය විෂයයන්)**

1. අධ්‍යාපන පර්යේෂණ ක්‍රම
   Research Methods in Education
2. අධ්‍යාපනයේ පදනම
   Foundations of Education

***දෙවන සෙමෙස්තරය*** **:**
**(පහත විෂයයන් අතරින් තුනක් පමණක් තෝරාගත යුතුය)**

1. උසස් සංඛ්‍යානය හා අධ්‍යාපන මනෝවිද්‍යාව
   Higher Statistics and Educational Psychology
2. විෂයමාලා න්‍යාය හා සංවර්ධනය
   Curriculum Theory and Development
3. සමාජ සන්දර්භය හා අධ්‍යාපනය
   Sociological Contents of Education
4. වැඩිහිටි හා අඛණ්ඩ අධ්‍යාපනය
   Adult and Constituting Education
5. අධ්‍යාපන පරිපාලනය
   Educational Administration
6. ඉගෙනුම් මනෝවිද්‍යාව
   Psychology of Learning

**ඉගැන්වීමේ මාධ්‍යය** : සිංහල

**ඇගයීම** : ඇගයීම මූලික අංශ දෙකකින් යුක්තවේ.

1. ***අභ්‍යන්තර ඇගයීම හෙවත් පාඨමාලාව කරගෙන යනු ලබන අතරතුර කරන ඇගයීම*** -
   මෙය පැවරුම්, කෙටි ලිඛිත පරීක්ෂණ, ඉදිරිපත් කිරීම් වැනි අංගවලින් යුක්ත වේ. සෑම විෂයයක් සඳහාම පවත්වන අවසාන ඇගයීමේදී ලකුණුවලින් 50% ක් මේ සඳහා වෙන්වේ.
2. ***පාඨමාලාව අවසානයේ කරනු ලබන ඇගයීම*** -
   ඒ ඒ සෙමෙස්තරය අවසානයේ පවත්වන ලිඛිත පරීක්ෂණය මීට අයත්වේ. අවසාන ඇගයුම සඳහා ලැබෙන ලකුණුවලින් 50% ක් මේ සඳහා වෙන්වේ.



- සෙමෙස්තරය අවසානයේ පවත්වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර ලැබෙනුයේ දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ යනාදියට සතුටුදායක පැමිණීමක් ඇති සිසුන්ට (80% කට නොඅඩු) හා ඒ ඒ විෂයයේ අභ්‍යන්තරඇගයීම සඳහා 50%කට නොඅඩු ලකුණු ලබාගත් සිසුන් සඳහා පමණි.
- අභ්‍යන්තර ඇගයීම සඳහා 50%ට වඩා ලකුණු අඩු අවස්ථාවල එම ඇගයුම සඳහා නැවත ඉදිරිපත් වී අවශ්‍යතා සපුරාගත හැකිය.
- විෂයයන් එකකින් හෝ කිහිපයකින් අසමත්වුවහොත් ඒ බව ලේඛකාධිකාරී විසින් ලිඛිතව දන්වනවා ඇත.
- කිසියම් විෂයයක් සඳහා විභාගයට පෙනී සිටියහැකි උපරිම වාර ගණන 3කි.
- කිසියම් අපේක්ෂකයෙකුට සෙමෙස්තරය අවසානයේ පවත්වන පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වුවහොත් එම විෂයයට හෝ විෂයයන්ට ඊළඟ අවස්ථාවේ පවත්වන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර ඉල්ලා සිටිය හැකිය. කෙසේ වෙතත් එලෙස පෙනී සිටීම පළමුවරට පෙනී සිටීමක් ලෙස සලකනු ලබන්නේ වෛද්‍ය සහතිකයකින් සනාථ කරනු ලබන රෝගී තත්ත්වයක් හෝ වෙනත් එබඳු පිළිගතහැකි හේතුවක් මත සනාතන සභාව අනුමැතිය ලබාදී ඇති අවස්ථාවකදී පමණි.
- පරීක්ෂණයකින් අසමත් වූ අපේක්ෂකයකුට එම පරීක්ෂණය පවතුවනු ලබන ඊළඟ වතාවේ ඊට පෙනී සිටිය හැකිය. කෙසේ වෙතත් එසේ පෙනී නොසිටියහොත් එම අවස්ථාව ඔහු හෝ ඇය පරීක්ෂණයට පෙනී සිටි අවස්ථාවක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. (පරීක්ෂණයට පෙනී සිටිය හැකි වාර තුනෙන් එකක් ලෙස සලකා බැලේ)
- පාඨමාලාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා ලබාදෙන උපරිම කාලය මුල් ලියාපදිංචි දිනයේ සිට අවුරුදු 6කි
- නියමිත සෑම විෂයයකින්ම සමත්වූ විට හා නිබන්ධයෙන් සමත්වූ විට ඔහුට හෝ ඇයට අධ්‍යාපනපති උපාධිය පිරිනැමේ.

**නිබන්ධනය බාරදීම හා ඇගයීම:**

- ඇගයීම සඳහා නිබන්ධය බාරදිය යුත්තේ මුල් ලියාපදිංචිවීමේ දිනයේ සිට අවුරුද්දකට පසුවයි. කෙසේ වෙතත් ඊට පෙර නිබන්ධයේ වැඩ අවසන් කිරීමට අවසර ඇත.
- අවසාන ලිඛිත පරීක්ෂණය පවත්වා අවසන්වූ දින සිට මාස තුනක් ඇතුළත නිබන්ධය බාරදිය නොහැකි වුවහොත් විධිමත් ක්‍රමයට ලියාපදිංචිය දීර්ඝ කරගෙන පසුව නිබන්ධනය භාරදිය හැකිය.
- නියමිත කාලසීමාව තුළ නිබන්ධය නිමකොට බාරදිය නොහැකි වීම නිසා ඒ සඳහා කල් ඉල්ලා සිටින සෑම විටම නිබන්ධය බාර ආචාර්යවරයා හරහා එම ඉල්ලීම කළ යුතුය. ඔහු ඒ සඳහා නිර්දේශය ලබාදෙනුයේ නිබන්ධය කරගෙන යාමේ ප්‍රගතියක් පෙන්වයි නම් පමණි.
  ලියාපදිංචිය දීර්ඝ කරගැනීම සඳහා නියමිත ගාස්තු ගෙවීමට සිදුවනු ඇත.
- නිබන්ධය පිළියෙල කළ යුත්තේ අධ්‍යාපන පීඨයේ උසස් උපාධි මණ්ඩලය අනුමත කර ඇති ආකෘතියට අනුවයි.
- නිබන්ධයේ මාතෘකාව අධ්‍යාපන පීඨයේ උසස් උපාධි මණ්ඩලය මගින් අනුමත කරවා ගත යුතුය.
- මාතෘකාවේ කිසියම් වෙනසක් කළහොත් එය ද එලෙස අනුමත කරවාගත යුතුය.
- පරීක්ෂකවරුන් දෙදෙනකු හෝ වැඩි දෙකනු නිබන්ධනය පරීක්ෂණයට ලක්කොට වාචික පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල නිකුත් කරනු ඇත.
- වාචික පරීක්ෂණයෙන් පසු පරීක්ෂක මණ්ඩලය මගින් නිබන්ධය සමත් කිරීමට හෝ අසමත් කිරීමට හෝ සංශෝධනවලට යටත්ව පිළිගැනීමට ඉඩ ඇත.
- සංශෝධනය කරන ලද නිබන්ධය නියමිත දිනට හෝ ඊට පෙර නිබන්ධය භාර ආචාර්යවරයාගේ අනුමැතිය ඇතිව බාරදිය යුතුය. කල්ගතවූ පසු බාරදෙන නිබන්ධන බාරනොගනු ඇත.



**සහභාගිත්වය හා නිබන්ධන උපදෙස් ලබාගැනීම:**

- පාඨමාලාව පැවැත්වෙන සෑම දිනකම අධ්‍යාපන පීඨයේ ඇති පැමිණීමේ ලේඛනයේ අත්සන්කොට පැමිණීම වාර්තා කළ යුතුය.
- සතුටුදායක පැමිණීමක් නොමැති අයට (80%) ට අඩු ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවසර නොදෙනු ඇත
- නිබන්ධන උපදෙස් ලබාගත් විට ඒ බව වාර්තා කිරීම සඳහා නිබන්ධය භාර ආචාර්යවරයා ළඟ ඇති පොතේ අත්සන් කළ යුතුය.
- ඔබ වෙත සපයනු ලබන ප්‍රගති වාර්තාවේ නිබන්ධය සම්බන්ධ ප්‍රගතිය සටහන් කළයුතු අතර ඒ සඳහා නිබන්ධය භාර ආචාර්යවරයාගේ අත්සන ලබාගත යුතුය.

## අධ්‍යාපන පීඨය

| | |
|---|---|
| පීඨාධිපති : | මහාචාර්ය චන්ද්‍රදාස චන්නිගම<br>(දු.ක 0112588812) |
| සහකාර ලේඛකාධිකාරී: | ජේ. තයානන්දන් මිය<br>(දු.ක 0112588812) |
| පාඨමාලා සම්බන්ධිකාරක: | ආචාර්ය සමුද්‍රා සෙනරත්<br>(දු.ක. 0112504734) |



## Master of Education (General) 2014/2015 Course

## Calendar of Dates

| | | |
|---|---|---|
| 1. | July 28 | Commencement of the course |
| 2. | July 28- September 10 | Lectures- 6 weeks<br>(First part of the first semester) |
| 3. | September 11 – September 24 | Short Break<br>(completion of two assignment ) |
| 4. | September 25- November 13 | Lectures 6 weeks<br>(Second part of the first semester) |
| 5. | November 14 – December 7 | Study Leave 3 weeks |
| 6. | December 8 – December 10 | First semester final examination |
| 7. | December 11 – December 31 | Vacation |
| 8. | January 01 (2015) | Final date for the submission of the research proposal |
| 9. | January 01 – April 8 | Second Semester (15 weeks) |
| 10. | April 9 – May 10 | Study Leave |
| 11. | May 11 – May 15 | Second semester final examination |
| 12. | May 16 – July 26 | Writing and finalizing the Research Report |
| 13. | July (2015) 27 | End of the course. |